පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 489

ආයතනයේ නම : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 489

நிறுவனத்தின் பெயர் : கமநல அபிவிருத்தி திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parliamentary Series No: 489**

**Name of the institution : Department of Agrarian Development**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: **489**

ආයතනයේ නම : **ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

| සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ගනු ලැබූ ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය |
|---|---|
| 01. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | උක්ත කරුණෙහි සඳහන් වන 2019 වර්ෂයේ සිට පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් 98 සඳහා මේ වන විට අවසන් පිළිතුරු ලබා දී ඇත. ඒ අනුව, 2019 වර්ෂයේ සිට 2026.05.30 දින දක්වා දෙපාර්තමේන්තුව වෙත ලද විගණන විමසුම් **692** න් විගණන විමසුම් **686** ක් සඳහා අවසන් පිළිතුරු ලබා දී ඇත. |

දෙපාර්තමේන්තුව වෙත ලද මුළු විගණන විමසුම් පිළිබඳ සාරාංශය

| දෙපාර්තමේන්තුව වෙත ලද විගණන විමසුම් | | **2026.05.30** දිනට පිළිතුරු ඉදිරිපත් කරන ලද විගණන විමසුම් ගණන | පිළිතුරු ලබා දීමට ඇති විගණන විමසුම් ගණන |
|---|---|---|---|
| වර්ෂය | විගණන විමසුම් ගණන | | |
| 2019 | 129 | 129 | - |
| 2020 | 110 | 110 | - |
| 2021 | 118 | 118 | - |
| 2022 | 219 | 219 | - |
| 2023 | 54 | 54 | - |
| 2024 | 32 | 32 | - |
| 2025 | 15 | 15 | - |
| 2026.05.30 | 15 | 09 | 06 |
| මුළු එකතුව | **692** | **686** | **06** |

| | |
|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025 වර්ෂයේ කාර්තු හතර පවත්වා ඇති අතර, 2026 වර්ෂයේ පළමු කාර්තු රැස්වීම ද පවත්වා ඇත.<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ මැදිහත්වීම මත 2025 වර්ෂයේ කාර්තු හතර සඳහා දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇති අතර, මහනුවර දිස්ත්‍රික්කයේ සිව්වන කාර්තුවේ රැස්වීම පැවති දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැවැත්වීමට පැවැත්වීමට නොහැකි වී ඇත. 2025 පළමු කාර්තුව තුළ මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය භාරව සහකාර කොමසාරිස්වරයෙකු නොසිටීම හේතුවෙන් එම කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා නොමැත. |
| **02.** සේවක පුරප්පාඩු | අනුමත කාර්ය මණ්ඩලය වැඩි කිරීම හා සංශෝධන, නව තනතුරු ඇති කිරීම සම්බන්ධව නැවත ඉල්ලීමක් 2026.01.07 දින කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් මඟින් කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.<br>ඒ අනුව, නව තනතුරු ඇති කිරීම සම්බන්ධයෙන් මු.රෙ. 71 ආකෘති පත්‍ර ද සමඟ ඉල්ලීම් සිදු කිරීම සුදුසු බව අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බැවින් අදාල ආකෘති පත්‍ර අමාත්‍යාංශ ලේකම් මඟින් කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද, අනෙතුක් තනතුරු වලට අදාල තනතුරු ඇති කිරීම සම්බන්ධයෙන් මු.රෙ 71 ආකෘති සකස් කරමින් පවතී. |
| **03.** වාර්ෂික කාර්ය සාධන වාර්තා සභාගත කිරීම | 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාර්ෂික කාර්ය සාධන වාර්තා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත. |

| | |
|---|---|
| **04.** ගොවිජන සංවර්ධන සභා පිහිටුවීම | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 51 වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන සභා පිහිටු වීමට අදාල නියෝග අංක 02 ට අදාලව නව සංශෝධනයන් 2025.11.12 දිනැතිව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.<br>නීති කෙටුම්පත් සම්පාදකගේ අංක L.D.B.11/2007(III) දරන 2026.01.20 දිනැති ලිපිය මඟින් නියෝග අංක 02ට අදාලව ඉදිරිපත් කරනු ලැබූ නව යෝජනා භාෂාත්‍රයෙන් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.<br>ඒ අනුව නියෝග අංක 02 ට අදාල සංශෝධනයන් සහ නව යෝජනාවන් භාෂා ත්‍රිත්ත්වයෙන් සකස් කර 2026.03.23 දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.<br>මෙම නියෝග සකස් කිරීමේ කාර්යය කඩිනම් කිරීම අරමුණු කර ගනිමින් දැනට පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක හා කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් සහ වාරි මාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ දී 2026.03.27 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්තුමාගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.<br>එහිදී නියෝග අංක 02 කොටසේ 53 වගන්තයෙහි තවදුරටත් සංශෝධනයන් සිදුවීම සුදුසු බවට නිරීක්ෂණය වූ අතර ඒ බව 2026.03.27 වන දින ලේකම්, කෘෂිකර්ම පශු සම්පත් ,ඉඩම් සහ වාරි මාර්ග අමාත්‍යාංශය වෙත දන්වන ලදී. 2026.04.08 දිනැති ලිපිය මඟින් ඒ සඳහා අනුමැතිය හිමි වූ අතර, ඒ අනුව අදාල සංශෝධනයන් සිදුකර ගැසට් පත්‍රයේ පළකිරීමට සුදුසු පරිදි නැවත සකස් කර ඉදිරිපත් කිරීමට අංක 7/7/2/ගො.සං.ප./නියෝග (VI) හා 2026.04.22 දිනැතිව නීතිකෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. |
| **05.** ගොවිජන බැංකුවල දුර්වල ක්‍රියාකාරිත්වය | ➢ 2022/ 2023 මහ හා 2023 යල කන්නයෙහි වී වගාව සඳහා ගොවීන් 73,968 ක් සඳහා ණය මුදල් නිකුත් කර ඇති අතර, ඒ අනුව සමස්ථ ගොවීන් සංඛ්‍යාව වන 1,000,000 ක ගෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 7% ක වර්ධනය වූ අගයක් පෙන්නුම් කරයි. |

| | |
|---|---|
| | ➢ 2023/2024 මහ හා 2024 යල කන්නයෙහි වී වගාව සඳහා ණය නිකුත් කර ඇති ගොවීන් සංඛ්‍යාව 39,184 ක් වන අතර, එහි අගය 3.9% ක ප්‍රතිශතයක් ද,<br><br>➢ 2024/2025 මහ හා 2025 යල කන්නයෙහි වී වගාව සඳහා ණය නිකුත් කර ඇති ගොවීන් සංඛ්‍යාව 46,637 ක් වන අතර, එය 4.66% ක ප්‍රතිශතයක් ද පෙන්නුම් කරයි.<br><br>ඒ අනුව, 1% ක ප්‍රතිශතය ඉක්මවා වී වගාවේ නියුතු ගොවීන් සඳහා ණය නිකුත් කර ඇත.<br><br>➢ පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයට අනුව ගිණුම් තැබීමට අවශ්‍ය පහසුකම් සකස් කරමින් පවතී.<br>➢ ගොවිජන බැංකු සඳහා වන ගිණුම්කරණ පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර, මෙම වසරේ ස්ථාපිත කිරීමට නියමිතය. |
| **06.** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීමේ දී මූල්‍ය අක්‍රමිකතා රැසක් සිදු වී තිබීම | උක්ත කරුණ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා 2023.02.06 දිනැතිව නිලධාරීන් පත් කර ඇති අතර, එම මූලික විමර්ශන වාර්තාව 2024.01.10 දිනැතිව ලබා දී ඇත. අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනාපත්‍ර කෙටුම්පත් කිරීමේ දී ලේඛනවල අඩුපාඩු නිරීක්ෂණය වූ බැවින්, 2025.07.21 දිනැතිව සංශෝධනය සඳහා යොමු කළ අතර, එම සංශෝධිත මූලික විමර්ශන වාර්තාව 2025.10.27 දිනැතිව ලැබී ඇත. එම වාර්තාවේ නිර්දේශයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.<br><br>I.තාක්ෂණ නිලධාරි ඊ.ඒ.අයි.එම්.ඒකනායක මියට සහ ගොවිජන සංවර්ධන නිලධාරි ජී.ආර්.සුදත් බංඩාර ගෝනාවල යන නිලධාරීන්ට විරුද්ධව චෝදනා පත්‍ර කෙටුම්පත් කරමින් පවතී.<br>II.මෙම ගොඩනැඟිල්ල ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයේ පවතී ද යන්න හා එහි ප්‍රමිතිය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ව්‍යවහාරික විගණනයක් සිදු කිරීමට 2026.04.17 දිනැතිව ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කර ඇත. |

III.මෙම අක්‍රමිකතාවයන්ට වගකිව යුතු තාක්ෂණ නිලධාරි ඒ.ඒ.එච්.ඩබ්.එම්.ඩී.අබේරත්න මහතා, ප්‍රාදේශිය ඉංජිනේරු බී.එම්.ජී.අළුත්ගමගේ මහතා සහ හිටපු ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් නයනා ප්‍රියදර්ශනී බුද්ධදාස මිය යන නිලධාරීන් මේ වන විට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.17 වගන්තිය යටතේ විශ්‍රාම ගොස් ඇති බැවින් ඔවුන්ට එරෙහිව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 19 වගන්තිය අනුව අලාභය අයකර ගැනීම සඳහා විගණකාධිපති වෙත යොමු කිරීම සඳහා ලිපි කෙටුම්පත් කරමින් පවති.

IV.මෙම ඉදිකිරීම් ආශ්‍රිතව සිදු වී ඇති දූෂණ ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා ලිපි කෙටුම්පත් කරමින් පවති.

- මෙම අක්‍රමිකතාවය සම්බන්ධයෙන් අලාභය සහ වගකිවයුතු නිලධාරින් නිශ්චය කර ගැනීම සඳහා 2024.10.22 දිනැතිව මු.රෙ. 104 පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර, ඊට අදාළ වාර්තාව 2025.12.26 දිනැතිව ලබා දී ඇත. එම වාර්තාවේ නිර්දේශයන්ට අනුව,

i.මුළු ඌණතාවයේ වටිනාකම රු.4,642,566.69 වන අතර, එම මුදල අදාල නිලධාරීන්ගෙන් අය කර ගැනීම සඳහා අධිකාරී බලය ලබා ගැනීමට 2026.0327 දිනැතිව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත.

ii.මෙම සිදුවීමට වගකිව යුතු නිලධාරීන් වන ගම්පහ මහාධිකරණයේ සේවයේ නියුතු තාක්ෂණ නිලධාරී ඊ.ඒ.අයි.එම්.ඒකනායක මියගෙන් අයවීමට ඇති රු.1,392,770.01 සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජේ.කේ.ජයනන්ද මයා වෙතින් අයවීමට ඇති රු.19,817.50ක මුදල ගෙවන ලෙස අදාල නිලධාරීන් 2026.03.07 දිනැතිව දැනුවත් කර ඇත. ඒ අනුව, ජේ.කේ.ජයනන්ද මයා වෙතින් අයවීමට ඇති රු.19,817.50ක මුදල කුවිතාන්සි අංක R/24 651043 යටතේ 2026.05.15 දිනැතිව ගෙවා අවසන් කර ඇත.

| | |
|---|---|
| | iii.මෙම අක්‍රමිකතාවයට වගකිව යුතු විශ්‍රාමික නිලධාරීන් වන තාක්ෂණ නිලධාරී ඒ.ඒ.එච්.ඩබ්.එම්.ඩී.අබේරත්න මයාගෙන් රු.1,392,770.01 හා ප්‍රාදේශීය ඉංජිනේරු බී.එම්.ජී.අළුත්ගමගේ මයාගෙන් රු.1,392,770.01 සහ හිටපු ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් නයනා ප්‍රියදර්ශනී බුද්ධදාස මියගෙන් රු.444,439.16 ලෙස මුළු මුදල වශයෙන් රු.3,229,979.18ක මුදල අයකර ගැනීමට පොදු දේපල පනත යටතේ කටයුතු කරන ලෙස නිර්දේශ කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| **07.** වැව් ප්‍රතිසංස්කරණ කටයුතු වලදී සිදුවන පරිසර හානි | වැව් ප්‍රතිසංස්කරණ කටයුතු වලදී සිදුවන පරිසර හානි අවම කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට සහ වැව්වල අයිතිය පිළිබඳව පවතින ව්‍යාකූල තත්ත්වය නිරවුල් කර ගැනීම සඳහා පළාත් සභා අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වයඹ පළාත් පරිසර අධිකාරිය යන ආයතන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මීලඟ රැස්වීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීමට කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| **08.** අයථා ලෙස කුඹුරු ඉඩම් ගොඩ කිරීම | මෙම කුඹුරු ඉඩම් ගොඩ කිරීම නිර්දේශ කළ නිලධාරීන්ගේ නම්, අනුමැතිය ලබා දුන් දිනයන් හා එහි වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් අංක DAD/FIN/PRO/04/COPA – ii හා 2024.07.15 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. |
| **09.** වී මිල දී ගැනීම සම්බන්ධ ගැටළු | මෙම කරුණ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල කරුණක් නොවන බව දන්වමි. |
| **10.** වගා ළිං 400ක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය | ආධාර ලබා දුන් ගොවීන්ගේ නාම ලේඛනය, නොගෙවා ඇති මුදල් ප්‍රමාණයන් හා වගා ළිං ඉදි කිරීමේ ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් අංක DAD/FIN/PRO/04/COPA – ii හා 2024.07.15 දිනැතිව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. |

ධම්මික රණතුංග
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ධම්මික රණතුංග
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක. 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537, කොළඹ 07.

ඩී.පී.වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.